# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
# මිල ගණන් කැඳවීම

**ඖෂධ / සැරහුම් ද්‍රව්‍ය / වෛද්‍ය වායුන්,**
**විකලාංග ශල්‍ය උපාංග / ශල්‍ය උපාංග / දන්ත ශල්‍ය උපාංග**
**/ දන්ත ඖෂධ හා සැරහුම්**
**හා අනෙකුත් වෛද්‍ය අයිතමයන් මිලදී ගැනීම.**

1. 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අවශ්‍ය පහත සඳහන් **විෂයයන් ස්ථාවර මිලක් යටතේ** මිලදී ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ හි පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ යුද්ධ හමුදා ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් මිල ගණන් කැඳවනු ලැබේ.

<table>
<tr><th>විස්තරය</th><th>ගොනු අංක</th><th>වටිනාකම (රු. මිලියන)</th><th>ඉල්ලුම්පත් භාරගන්නා හා ටෙන්ඩර්පත් නිකුත් කරන දිනය හා වේලාව (සෙනසුරාදා/ඉරිදා සහ රජයේ නිවාඩු දින හැර 0930 පැයේ සිට 1600 පැය)</th><th>ටෙන්ඩර්පත් විවෘත කරන දිනය හා වේලාව</th></tr>
<tr><td rowspan="4">• ඖෂධ හා සැරහුම් (Pharmaceutical & Medical Consumables)</td><td rowspan="4">DAMPS/TENDER/2021/001 සිට 093 දක්වා</td><td rowspan="4">468.91</td><td rowspan="4">2020.11.02 සිට 2020.11.20</td><td>2020.11.30 - 1100 පැයට ගොනු අංක 001 සිට 025 දක්වා</td></tr>
<tr><td>2020.12.07 - 1100 පැයට ගොනු අංක 026 සිට 050 දක්වා</td></tr>
<tr><td>2020.12.14 - 1100 පැයට ගොනු අංක 051 සිට 075 දක්වා</td></tr>
<tr><td>2020.12.21 - 1100 පැයට ගොනු අංක 076 සිට 093 දක්වා</td></tr>
<tr><td>• දන්ත ශල්‍ය උපාංග (Items for Dental Surgery Accessories)</td><td>DAMPS/DEN/ACCE/2021/01 සිට 13 දක්වා</td><td>8.93</td><td rowspan="5">2020.11.02 සිට 2020.11.20</td><td>2020.11.27 - 1100 පැයට ගොනු අංක 01 සිට 13 දක්වා</td></tr>
<tr><td rowspan="4">• දන්ත ඖෂධ හා සැරහුම් (Pharmaceuticals & Dental Consumables)</td><td rowspan="4">DAMPS/DEN/CONS/2021/14 සිට 76 දක්වා</td><td rowspan="4">78.74</td><td>2020.12.04 - 1100 පැයට ගොනු අංක 14 සිට 30 දක්වා</td></tr>
<tr><td>2020.12.11 - 1100 පැයට ගොනු අංක 31 සිට 45 දක්වා</td></tr>
<tr><td>2020.12.18 - 1100 පැයට ගොනු අංක 46 සිට 60 දක්වා</td></tr>
<tr><td>2020.12.23 - 1100 පැයට ගොනු අංක 61 සිට 76 දක්වා</td></tr>
<tr><td>• ශල්‍යාගාර අවශ්‍යතා (Items for Operation Theatres)</td><td rowspan="2">DAMPS/TENDER/2021/094 සිට 149 දක්වා</td><td rowspan="2">201.90</td><td rowspan="2">2020.11.23 සිට 2020.12.18</td><td>2021.01.06 - 1100 පැයට ගොනු අංක 094 සිට 122 දක්වා</td></tr>
<tr><td>• රසායනාගාර ප්‍රතිකාරක සහ රසායනාගාර ද්‍රව්‍ය (Laboratory Chemicals & Reagents)</td><td>2021.01.11 - 1100 පැයට ගොනු අංක 123 සිට 149 දක්වා</td></tr>
<tr><td>• විද්‍යුත් ඛන්තුක රේඛණ ද්‍රව්‍ය (Items Required for ECG Sections)</td><td rowspan="4">DAMPS/TENDER/2021/150 සිට 192 දක්වා</td><td rowspan="4">64.77</td><td rowspan="12">2020.12.21 සිට 2021.01.08</td><td rowspan="2">2021.01.15 - 1100 පැයට ගොනු අංක 150 සිට 164 දක්වා</td></tr>
<tr><td>• රුධිර කාන්දුකරන ඒකකයට අවශ්‍ය ද්‍රව්‍ය (Requirements for Dialysis Unit)</td></tr>
<tr><td>• සටන් සුනඛයන් සහ අශ්වයන් සඳහා ඖෂධ (Medicines for Tracker Dogs & Horses)</td><td rowspan="2">2021.01.22 - 1100 පැයට ගොනු අංක 165 සිට 192 දක්වා</td></tr>
<tr><td>• විකලාංග හා සාමාන්‍ය ශල්‍ය උපාංග (Items for Orthopedic and General Surgery)</td></tr>
<tr><td>• වෛද්‍ය පුනරුත්ථාපන උපකරණ (Items for Medical Rehabilitation)</td><td rowspan="6">DAMPS/TENDER/2021/193 සිට 217 දක්වා</td><td rowspan="6">82.88</td><td rowspan="6">2021.01.29 - 1100 පැයට ගොනු අංක 193 සිට 217 දක්වා</td></tr>
<tr><td>• ක්‍රීඩකයන්ගේ අවශ්‍යතා (Sports Medical Requirements)</td></tr>
<tr><td>• භෞතචිකිත්සක ඒකක අවශ්‍යතා (Items for Physiotherapy Sections)</td></tr>
<tr><td>• දැඩි සත්කාර ඒකකය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය (Items for ICU)</td></tr>
<tr><td>• විකිරණ රශ්මි පටල, ප්‍රතිකාරක හා රසායන ද්‍රව්‍ය (X-ray Films, Reagents & Consumables for Radiology)</td></tr>
<tr><td>• මධ්‍යම වන්ධ්‍යකෘත සැපයුම් දෙපාර්තමේන්තුව (Items for Central Sterilization Supply Department) සඳහා ඇවැසි අයිතම</td></tr>
<tr><td>• වෛද්‍ය වායුන් (Medical Gases)</td><td rowspan="2">DAMPS/TENDER/2021/218 සිට 231 දක්වා</td><td rowspan="2">94.97</td><td rowspan="2">2021.02.03 - 1100 පැයට ගොනු අංක 218 සිට 231 දක්වා</td></tr>
<tr><td>• ප්‍රතිශක්තිකරණ එන්නත් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය (Items for Preventive Medicine)</td></tr>
</table>

2. මිල ගණන් ඉදිරිපත් කරන සියළුම සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන NMRA සහතික වල වලංගුභාවය අවම වශයෙන් 2021.12.31 දින දක්වා තිබිය යුතු අතර, එම දිනට පෙර කල් ඉකුත් වන NMRA සහතිකයක් ඉදිරිපත් කරන්නේනම්, එම NMRA සහතිකය කල් ඉකුත් වූ විගස නව වලංගු NMRA සහතිකයක් ලබාදෙන බවට සහතික කරන ලද ලිපියක් මිලගණන් පත සමග ඉදිරිපත් කල යුතුය.

3. ඉදිරිපත් කරන අයිතමයන් සඳහා Bioequivalence Studies වාර්තාවන් තිබේනම් මිල ගණන්පත් සමග ඉදිරිපත් කළ යුතුය. තවද මිල කැඳවීමේ නිවේදනය සහ ටෙන්ඩර් කොන්දේසි දැන්වීමේ සඳහන්ව ඇති පරිදි නිදර්ශක (Samples) ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

4. යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ හිදී රාජකාරී කාලසීමාව (0900 පැයේ සිට 1600 පැය) තුල ඉහත ඇති දිනයන්හි දී සියළුම ටෙන්ඩර් ලිපිගොනු පරීක්ෂා කිරීම සිදු කළ හැක.

5. ඉහත සඳහන් සැපයීම් වෙනුවෙන් ටෙන්ඩර්කරුවන් විසින් සේවාවන් සැපයිය හැකි බවට සාධක සහ ආදායම් පිළිබඳ ස්ථාවරත්වය සනාථ කිරීම සඳහා පසුගිය මාස හය ඇතුළත පවත්වාගෙන ගිය බැංකු ප්‍රකාශන වල ඡායා පිටපතක් සහිත ලිඛිත අයදුම්පත්, සමාගමක් වශයෙන් ලියාපදිංචි සහතිකය සමග ඉදිරිපත් කල යුතු අතර, සැපයුම්කරුවන් වෙත ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබනුයේ අදාළ ලියකියවිලි පරීක්ෂා කිරීමෙන් අනතුරුව පමණි. එහෙත්, මෙම කොන්දේසි 2020 වසර වෙනුවෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ මෙම වර්ගීකරණය යටතේ ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් හට බලනොපානු ඇත.

6. ටෙන්ඩර් ආකෘතිපත් හා ඉහත එක් එක් විෂයන් යටතේ අවශ්‍ය වන දෑ හා ප්‍රමාණය පිළිබඳ සවිස්තර වාර්තා වෛද්‍ය උපර්ජන සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ හි තබා ඇති අතර, සැපයුම්කරුවන් හට ඒ ආශ්‍රයෙන් තමන් සැපයීමට අපේක්ෂා කරන විෂය හා ගොනුව තෝරාගත හැක. එසේ තෝරාගනු ලබන එක් එක් විෂයන් සඳහා ගාස්තු වශයෙන් ගොනුවේ වටිනාකම රුපියල් මිලියන 10ට අඩු එක් ගොනුවක් සඳහා රුපියල් 1.000.00ක් ද රුපියල් මිලියන 10 සිට 50 දක්වා එක් ගොනුවක් සඳහා රුපියල් 3,500.00ක් වශයෙන් ආපසු නොගෙවනු ලබන මුදලක්, මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ වෙත ගෙවා එම ලදුපත් වෛද්‍ය උපර්ජන සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ වෙත (සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දින හැර) ඉදිරිපත් කිරීමෙන් පසුව අදාල ටෙන්ඩර් ආකෘතිපත්‍ර හා විස්තර ලබා ගත හැක.

7. ටෙන්ඩර් විවෘත කිරීම අදාල විෂයන්ට ඉදිරියෙන් ඇති දිනවල පෙ.ව. 11.00 ට යුද්ධ හමුදා මූලස්ථානයේ යුද්ධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව මගින් යුද්ධ හමුදා කඳවුර, සෙලින්කෝ ගොඩනැගිල්ල, අංක. 167/30, අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත යන ස්ථානයේ දී සිදුකෙරේ.

වැඩි විස්තර සඳහා වෛද්‍ය උපර්ජන අංශය - 0112-553256

**යුද්ධ හමුදාධිපති**
යුද්ධ හමුදා මූලස්ථානය
ශ්‍රී ජයවර්ධනපුර
කොළඹ